# නව වසරෙහි ආපසු හැරී බලමු

වඩු කාර්මිකයෙක් හෝ පෙදරේරුවෙක් (මේසන් බාස්) සිය කටයුතු කරන සැටි ඔබ දැකැ ඇතැයි මම සිතමි. දැකැ තිබේ නම්, ඔහුගේ ක්‍රියා පිළිවෙත ඔබගේ ජීවිතය පවත්වා ගැනීම සමඟ කිසි විටෙකවත් ගලපා බැලුවා ද ? ඔබට මෙතෙක් කලක් එය කල නො හැකි වී නම්, අදට ද එය ප්‍රමාද වැඩි නැත. එළැඹුණු නව වසරේ දී ඒ ගැන සිතා බලන්න.

වඩු කාර්මිකයා, ලීයක් කිසියම් ප්‍රමාණයකට කපන්නේ නම් හෝ, ලීයෙකැ ඇද හැරීමට යතු ගාන්නේ නම්, තරමක් එය නිමැ වු පසු, ඇවැසි පමණට එය හරිදැයි නිගමනය කිරීම සඳහා කෝදුව-මිම්ම හෝ නියමිත හැඩ රුව සමඟ එකට තියා හරි-වැරදි බැලීම කිහිප විටක් මැ සිදු කරයි.

පෙදරේරු කාර්මිකයා ගඩොල් වරි කිහිපයක් ගොඩ නැඟූ පසු ළඹ කැටය, මුල මට්ටම හෝ 'ස්පිරට් ලෙවල් එක' තබා නිමැ වූ කොටසේ ඇද-කුද ඇතිදැයි විමසා බලයි. මෙම ක්‍රියාව ඉතා වැදගත් පියවරක් වනුයේ ඔහුගේ ඉදිරි කටයුතු ඇද නැතිවැ කරැගෙනැ යාමට එය නොමඳ වැ පළදායි වන හෙයිනි.

මෙම ක්‍රියා පිළිවෙත ඔබ විසින් සිය-දහස් වරක් වුවත් දැකැ ඇතුවාට සැක නැත. එහෙත් එය ඔබගේ ජීවිත ගමන සමඟ ගලපා බලන්නට කිසි විටෙකැ වත් ඔබ සිතා බැලුවා ද ? මිනිසුන් ලෙස අප මෙලොවැ ජීවත් වනුයේ කිසියම් සීමිත වසර ගණනෙකි. බොහෝ කලෙකට පෙරැ එය වසර 120 ක් යැයි සිතූහ. එයට පාදක වූයේ ජ්‍යෝතිෂයෙහි එන මහ දසා සියල්ල ගෙවීමට වසර 120 ක් ඇවැසි නිසා වියැ යුතු යැ. එහෙත් එම මුළු කාල සීමාව මැ ගත කරන්නෝ දුලබ වෙති. නො වන්නේ මැ ද නැත. අනෙකුත් අය එයට අඩු කලක් ජීවත් වී මිය යති.

කිසි මැ කෙනෙකු සිය ජීවිතයෙහි අතරැ මඟැ දිනෙකැ ආපසු හැරී බලා, තමා ගෙවූ ජීවිත කාලය පිළිබඳවැ තමාට සතුටු විය හැකිදැයි පුනරාවර්ජනය කළ බවක් මම නම් නො දනිමි. කිසියම් සුවිශේශී කෙනෙකු විසින් එය කළේ නම්, ඔහු එය ලොවට හඬ නගා කියා පෑවේ නැත. එම නිසා මා අදහස් කළේ මෙහි ඇති අගය උගත් පාඨක සමූහයා සමඟ කතා-බහ කරැ, දැනුම බෙදා ගැනිමට යැ.

අප අතරේ කිසිවෙකුට තම ජීවිතයේ හරි අඩ කුමක්දැයි සිතා ගැනිමට හැකි කමක් නැති බව මම පිළිගනිමි. එහෙත් තමාගේ දැනුමේ පමණට, මා දැන් මැදි වියට පැමිණ ඇතැයි උපකල්පනය කිරීමේ වරදක් නැත. පොදුවේ බලන විටැ වසර 40 මිනිසෙකුගේ මැදි විය සේ සලකන ප්‍රවනතාවයක් තිබෙන බව පෙනේ. 50 විය සපිරීම නම් ජීවිතයේ පශ්චිම වියට පැමිණීමේ හොඳ මැ සාධකයෙකි.

මෙම මිනිමු දඬු දෙකින් කුමක් හෝ මතැ පිහිටා, තමාගේ ගෙවී ගිය ජීවිතයෙහි සිදු වූ හරි-වැරදි සොයා බැලීම වඩුවෙකු හෝ පෙදරේරුවෙකු කරන පරිදි මැ සිදු කළ යුතු යයි මම සිතමි. එසේ කිරීමේ දී තමා විසින් කරැ ඇති නො මනා හෝ අනිටු පල ගෙනැ දුන් කිසියම් ගති පැවැත්මක් තිබී ඇති බව තමාට පෙනේ නම්, එය අත් හැරැ දැමීම යනු වඩාත් හොඳ ඉදිරි ගමනකට හිමිකම් ලබා ගැනීමෙකි.

අප දන්නා ගම්බද හෝ නගරබද හෝ ජීවිත බොහෝ ගණනක් ගෙනැ, ඉතා ළං වැ බැලුව හොත් අඹු-සැමි අඬ දබර, දෙමා-පියන් නොසලකා හැරීම, දරුවන් කීකරු කරැ ගැනීමට අපොහොසත් වීම. අසල්වාසීන් (නෑ දෑ හිතවතුන්) අතරැ හොඳ හිත පළුදු වීම් අතින් විවිධ අඩු-පාඩු සිදු වන බවක් අපට දක්නට ලැබේ. අප විසින් එවැනි ගති-පැවතුම් කරපින්නාගෙනැ අපගේ මරණය තෙක් මැ ජීවත් වියැ යුතු නැත. වඩුවෙකු හෝ පෙදරේරුවෙකු අයුරින් මැ, අතර මඟැ දිනෙකැ ආපසු හැරී බලා, 'ජීවිතයේ ඇද හැරැගැනිම' කළ හැකිනම් එය කො පමණ නැණවත් ක්‍රියාවක් ද ?

මෙය හැම කෙනෙකුට මැ නිහඬ වැ කරැ ගත හැකි ස්වයං සංශෝධනයක් වුවත්, එය ඒ අයුරින් පිළිගන්නේ කීයෙන් කී දෙනෙක් ද ? බොහෝ දෙනෙකු විසින් එයට එකඟ නො වන්නේ ඇයි ? තමාගේ සිත තමාට අවනත නැති නිසා යැ. කරිවිල වැලෙහි හැදෙන පණුවා කරිවිල ගෙඩියෙහි තිත්ත රස නොදන්නා සේ මැ, වරදට හුරු වූ තැනැත්තාට ද එම වරදෙහි නුගුණ-නීරසය දැනෙන්නේ නැත.

දෙව් ලොවැ දිවිය කො තරම් මිහිරි බවක් බණ-දහමින් කියා පෑව ද, එවන් දෙව් ලොවකට යාම සඳහා අද-අද මැ මිනිස් ජීවිතය අත්හරින්නට කැමැත්තෝ කවරහු ද ? මාගේ ගුණ දොස් විමැසුම් ද ඒ අයුරැ මැ වියැ හැකි යැ. එහෙත්, සමාජයෙහි අස්සක්-මුල්ලක් නො හැර සොයා බැලුව හොත්, ජීවිතයේ අතරැ-මඟ දී පැරැණි නොමනා සිරිත් අත් හැරැ දැමුවන් නැත්තේ මැ නොවේ. අඟුල්මල් තෙරුන් තරම් හොඳ නිදසුනක් අපට සොයා ගත හැකි වෙතැයි මම නම් නො සිතමි.

අපට අද නිසි මඟ සොයා දෙන්නට බුදු වරයෙක් ඇත්තේ නැත. එහෙත්, ගෞතම බුදු හිමියන් දෙසා වදාළ දහම ගමන් මඟ නිදොස් කර ගැනීමට හොඳට මැ ප්‍රමාණවත් බව අප විසින් පිලිගත යුතු යැ. එදිනෙදා අසන්නට ලැබෙන සෑම බණ වරක් ගානේ මැ ගති-ගුණ නිදොස් කරැ ගැනිම කළ නොහැකි නම්, කෙනෙකු පනස් වියට එළැඹෙන දිනයේ දී වත් ආපසු හැරී බැලීම කොතරම් කාලෝචිත දැයි සිතා බැලිය යුතු යැ

උදා වු නව වසර හැම කෙනෙකුට මැ තමා ගෙවූ ජීවිතය දෙසැ ආපසු හැරී බැලීමට හොඳ මැ අවස්තාවකි. ඉතා නිරහංකාර වැ එය පිලිගෙනැ, වඩාත් නිවැරදි, පලදායී අනාගතතයකට පිවිසීමට කිසිවෙකු සිතන්නේ නම් එය මහත් පල, මහානිශංස ලැබෙන ක්‍රියාවක් මැ වනු ඇත. එම නිසා අප හැම දෙනා මැ නව වසර නමැති අළුත් ඇඳුම ඇඟැ ලා ගන්නට පෙරැ, ස්වයං තීරණයක් මතැ තමාගේ පැරැණි නුගුණ සෝදා, පිසැ දා ගනිමු;

සැමට මැ නව වසර වඩාත් පලදායී වසරක් මැ වේවා!



සිරිවිමල මුතුකුමාරණ
ඩැන්ඩිනොං

## පාළි පාඨ හෙළ බසින් 36

"අචිරං වත්යං කායෝ
පඨවිං අධිසේසති
පුද්ධෝ අපේත විඤ්ඤාණෝ
නිරත්ථං'ව කලිංගරං"
(ධම්ම පද 41-චිත්ත වග්ග)

ඉවත්වු පසු වැ විඤ්ඤාණය
නො තිර වූ මේ කය
අනැ'වැසි දෙයක් වන'තර
පොළවට අයත් වී යයි.

සිරිවිමල මුතුකුමාරණ - ඩැන්ඩිනොං

# Glaring prospect of the best of international cricket 1n 2018: early signs give signals.



The Best of the Best

Alatair Nathan Cook has signalled that 2018 will be full of spectacular and entertaining international cricket by his score of 244 not out in the fourth Ashes Test by a visiting batsman at the MCG, surpassing West Indies Viv Richards' 208 in 1984. Bob Cowper holds the overall record at the ground with his score of 307 in 1966. Cook scored the 244 not out in 409 balls with 631 maidens and 27 fours.

Cook is poised to become the first batsman to carry his bat through a completed innings at the MCG. He would be the eighth English batsman to achieve this feat at any ground, and the first since Mike Atherton in 1997. It was his fifth double century, his highest score against Australia and the third-highest of his Test career. He surpassed Brian Lara and Shivnarine Chanderpaul (West Indies), and Mahela Jayawardene (Sri Lanka) to become the sixth-highest scorer in Test cricket with 11,956 runs.

Alstair Cook, born on December 25 !984, is an English cricketer. He was a former Skipper of English Test and One Day International (ODI) Teams.

He is regarded as one of the greatest batsmen ever to play for England and one of the most prolific batsmen in the modern era.

Dr Mathu H Liyanage
Adelaide